දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ආචාර්යවරියක හා සාකච්ඡා කර සැකසුනු ලිපියක් සිළුමිණ පුවත්පතේ (මාර්තු 05, 2023) පළ වී තිබිණි.
එම සාකච්ඡාව තුල "සිය දිවි නසා ගැනීම කියන්නේ අපරාධ නීතිය යටතේ වරදක්, දණ්ඩ නීති සංග්‍රහයෙන් එය වරදක් ලෙසින් සලකා ඊට අදාළ දඬුවමකුත් ඉදිරිපත් කර තිබෙනවා" යනුවෙන් එම ආචාර්යවරියව උපුටා දක්වමින් සඳහන් කර ඇත.
කෙසේ නමුත්,
* ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අංක 302 වගන්තිය යටතේ, දිවි තොර කරගැනීමට තැත් කිරීම දඬුවම් ලැබෙන වරදක් ලෙසින් මින් පෙර පෙන්වා දී තිබිණි.
* නමුත්, 1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනය පනත ඔස්සේ, අංක 302 වගන්තිය අහෝසි කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා නීතියට අනුව, තවදුරටත් දිවි නසා ගැනීමට තැත් කිරීම අපරාධකාරී ක්‍රියාවක් නොවේ.
* දිවි තොර කරගැනීමක් අපරාධයක් ලෙසින් දැක්වෙන "committed suicide" යන්න පවා භාවිතා කිරීමෙන් වළකින ලෙසට ජාත්‍යන්තර මාධ්‍ය මාර්ගෝපදේශයන් සඳහන් කරයි.
එසේ නම්,
1) මෙය දිවි තොර කරගැනීම් වැළැක්වීම පිළිබඳව සමාජ අවබෝධයක් ඇති කිරීමේ ධනාත්මක අදහසකින් ලියවුණු ලිපියක් වුවද, එහි කරුණු නිරවද්‍ය භාවය සම්බන්ධයෙන් අදාළ මාධ්‍යවේදියා සැලකිලිමත් විය යුතු නොවන්නේ ද? මෙය අදාළ අංශයක ප්‍රවීණයෙකු සමග කළ සාකච්ඡාවක් ඔස්සේ ලියවුණත්, එහි කරුණු වල නිවැරදි බව සොයා බැලීමේ වගකීම පුවත්පත සතු වෙතැයි ඔබ නොසිතන්නේ ද?
2) දිවි තොර කරගැනීම අපරාධයක් ලෙසින් දැක්වීම ඔස්සේ, දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් සමාජය තුළ ඇති ගර්හාව වඩාත් තීව්‍ර නොකෙරෙන්නේ ද?
කෙසේ වෙතත්, මෙවැනි ලිපියක් සමඟින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම ප්‍රශංසනීය බවද මෙසේම සඳහන් කරමු.
උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
* CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
මූලාශ්‍ර:
https://www.lawnet.gov.lk/penal-code-amendment-6/ https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf... https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# දිවි අහිමි කර ගැනීම අපරාධයක් ලෙසින් නොසලකමු!

## දිවි කුසුම මිලින කරන්න ඇයි මෙච්චර පෙලඹවීමක්

ඔබ වෙනුවෙන් සේවය සැලසීමට
'සුමිත්‍රයෝ' සෑම දිනකම උදෑසන 9.00 සිට
රාත්‍රී 8 දක්වා විවෘතය.
සුමිත්‍රයෝ 60 බී,
හෝර්ටන් පෙදෙස, කොළඹ 07
දුරකතන අංක
011- 2696666/ 2692909

"සිය දිවි නසා ගැනීම කියන්නේ අපරාධ නීතිය යටතේ වරදක්. දණ්ඩනීති සංග්‍රහයෙන් එය වරදක් ලෙස සලකා ඊට අදාළ දඬුවමකුත් ඉදිරිපත් කර තිබෙනවා.

සිළුමිණ The Silumina

2023-03-05

**උපකාරක අංක සඳහන් කිරීම ප්‍රසංශනීයයි!**

ETHICS EYE
පිටු මායිමෙන් ඔබ්බට